SLAASMB

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන
ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය



# වාර්ෂික වාර්තාව ’11

# මණ්ඩලය...

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය,
1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත
මගින් සංස්ථාපනය කරන ලදී.

නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්* විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, ඉදිරිපත් කිරීමේදී හා විගණනය කිරීමේදී, ශ්‍රී ලංකා ගිණුම් හා ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට එකඟව ක්‍රියාකරන බවට අධීක්ෂණය කිරීම මණ්ඩලයේ කාර්යභාරය වේ. *(25 පිටුව බලන්න)

## පටුන


මණ්ඩලයේ සාමාජිකයින් ........ 01
වර්ෂයේ සමාලෝචනය ........ 05
2011 වසර තුළ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයේ සොයා ගැනීම් ........ 08
2011 වසර තුළ රාජ්‍ය සංස්ථා සහ ලැයිස්තුගත සමාගම්වලින් ලබාගත් එකඟතාවන් ........ 09
මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකළ ලැස්තුගත සමාගම් සහ රාජ්‍ය සංස්ථා ........ 10
විගණන සමාලෝචනවල සොයා ගැනීම් ........ 11
තුලිත ලකුණු පත ........ 13
විගණකාධිපති වාර්තාව ........ 15
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය ........ 17
මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රකාශනය ........ 18
ශුද්ධ වත්කම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය ........ 19
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ........ 20
මූල්‍ය ප්‍රකාශනවලට සටහන් ........ 21
නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් ........ 25

# මණ්ඩලයේ සාමාජිකයින්

| | |
|---|---|
| **සභාපති** | |
| මහ බැංකු අධිපති නම් කළ නියෝජිත | පී. සමරසිරි B.A. (Hons.), M.A. (Economics)<br>සහකාර අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුව |
| නිල බලයෙන් | ඩී.කේ. හෙට්ටිආරච්චි LLB, නීතිඥ<br>සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් |
| | කේ. එම්. එස්. කන්දෙගෙදර BSc., (Hons.), Dip. in Tax Admin. (USA) *(2011 දෙසැම්බර් 25 දක්වා)* |
| | *එම්. සමරසේකර මිය* BSc., MPM *(2011 දෙසැම්බර් 26 සිට)*<br>දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් |
| | එම්. කාදර් නීතිඥ, Solicitor (UK) *(2011 නොවැම්බර් 11 දක්වා)*<br>ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල් |
| **නම් කළ නියෝජිත** | |
| ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය (ශ්‍රී ලං.ව.ග.ආ.) | එස්. රාජපක්ෂ MBA, FCA<br>සභාපති, ශ්‍රී ලං.ව.ග.ආ.<br>හවුල්කරු, බී.ඩී.ඕ. පාට්නර්ස් |
| | ඒ. හේරත් BSc., MBA, FCA<br>හවුල්කරු, අර්න්ස්ට් සහ යංග් |
| | ඩී.ටී.එස්.එච්. මුදලිගේ FCA, FCMA (UK), FCCA, FCPA<br>හිටපු සභාපති, ශ්‍රී ලං.ව.ග.ආ.<br>හවුල්කරු, ප්‍රයිස්වෝටර්හවුස්කූපර්ස් |
| එක්සත් රාජධානියේ කළමනාකරණ ගණකාධිකාරීන්ගේ වරලත් ආයතනය (ශ්‍රී ලංකා අංශය) | සී.එල්.කේ.පී. ජයසූරිය FCMA (UK), FCCA<br>සභාපති සහ කළමනාකරණ අධ්‍යක්ෂක, ෆින්ලේස්, කලම්බෝ පී.එල්.සී. |
| ශ්‍රී ලංකා නීතීඥ සංගමය | එෆ්.එන්. ගුණවර්ධන නීතිඥ, MBA, ACA, ACMA (UK), CFA<br>හවුල්කරු, නිත්‍ය හවුල්කරුවන් |
| ලංකා වාණිජ මණ්ඩලය | එන්. සිවප්‍රගාසම් මෙනවිය FCA, FCMA (UK)<br>ප්‍රධාන මූල්‍ය නිලධාරි, එයිට්කන් ස්පෙන්ස් පී.එල්.සී. |
| ශ්‍රී ලංකා කර්මාන්ත, වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය | ඩබ්.කේ.එච්. වේගපිටිය BSc., MBA<br>සභාපති, ලාෆ්ස් හෝල්ඩිංස් සමාගම |
| ශ්‍රී ලංකා බැංකු සම්මේලනය | ආර්. ත්‍යාගරාජා MBA (ක්‍රැන්ෆීල්ඩ්), FCA, FCMA (UK)<br>කළමනාකරණ අධ්‍යක්ෂක/ප්‍රධාන විධායක නිලධාරි, හැටන් නැෂනල් බැංකුව |
| විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව | කේ.එස්.ටී.එස්. ජයසූරිය මිය ACA<br>මූල්‍ය අධිකාරී, කොළඹ විශ්වවිද්‍යාලය |
| මණ්ඩලයේ ලේකම් | ඒ. එස්. රත්නායක FCA, FCMA (UK), ACCA, CMA, FCMI, FCMA, CGMA<br>අධ්‍යක්ෂ ජනරාල් |

# මණ්ඩලයේ සාමාජිකයින්



*ඉදිරි පෙළ: වමේ සිට දකුණට*

ඒ. හේරත්, එන්. සිවප්‍රගාසම් මෙනවිය, ඒ.එස්. රත්නායක (අධ්‍යක්ෂ ජනරාල්), පී. සමරසිරි, කේ.එම්.එස්. කන්දෙගෙදර, එම්. කාදර්

*පසු පෙළ: වමේ සිට දකුණට*

පී.වයි.එස්. පෙරේරා (ආරාධිත - සභාපති, විගණන ප්‍රමිති කමිටුව), එෆ්.එන්. ගුණවර්ධන, ඩබ්.කේ.එච්. වේගපිටිය, සී.එල්.කේ.පී. ජයසූරිය, ඩබ්.එන්.අයි.සී. ප්‍රනාන්දු (ආරාධිත - සභාපති, ගිණුම් ප්‍රමිති කමිටුව), වී. කනගසභාපති (ආරාධිත - උපදේශක, මූල්‍ය අධ්‍යයන ආයතනය, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය)

*පින්තූරයේ නොමැති*

ඩී.කේ. හෙට්ටිආරච්චි, කේ.එස්.ටී.එස්. ජයසූරිය මිය, ඩී.ටී.එස්.එච්. මුදලිගේ, එස්. රාජපක්ෂ, එම්. සමරසේකර මිය, ආර්. ත්‍යාගරාජා

# මණ්ඩලයේ සාමාජිකයින්

**පී. සමරසිරි** - *BA(Hons.), MA(Economics)*

වර්ෂ 2009 සිට මණ්ඩලයේ සභාපති වන පී. සමරසිරි මහතා ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර අධිපතිවරයෙකි. ශ්‍රී ලංකා මහ බැංකුවේ වසර 29 කට අධික සේවාකාලයක් සපුරන මොහු එහි මූල්‍ය මණ්ඩලයේ ලේකම් තනතුරද හොබවයි. මොහුගේ පුළුල් දැනුම් පරාසය ආර්ථිකමය, මූල්‍ය ස්ථාවරත්වය හා රීතීන් වැනි ක්ෂේත්‍ර දක්වා විහිදේ. තවද මොහු ආර්ථික, බැංකු හා මූල්‍ය රීතීන් සම්බන්ධ ලිපි හා පොත්ද රචනා කර ඇත.

එෆ්.එන්. ගුණවර්ධන - *නීතිඥ, MBA, ACA, ACMA (UK), CFA*

ගුණවර්ධන මහතා නීති ආයතනයක් වන නිත්‍ය හවුල්කරුවන්ගේ ආදිකර්තෘ හවුල්කරු වෙයි. මොහු නීතිපති දෙපාර්තමේන්තුවේ හා අර්න්ස්ට් සහ යංග් ආයතනයේ බදු අංශයේ සේවය කිරීමෙන් ලත් අත්දැකීම්වලින් හෙබි පුළුල් පරාසයක විහිදෙන විශේෂතාවලින් සපිරි පුද්ගලයෙකි. එසේම, මොහු මූල්‍ය නීතිය, සමාගම් ඒකාබද්ධ කිරීම් හා අත්පත්කරගැනීම්, ණය හා ස්කන්ධයන් නිකුත් කිරීම්, බදු, සුරැකුම්කරණය හා ව්‍යුත්පන්න යන ක්ෂේත්‍රයන්හි විශේෂඥවරයෙකුද වෙයි.

**ඒ. හේරත්** - *BSc., MBA, FCA*

හේරත් මහතා අර්න්ස්ට් සහ යංග් ආයතනයෙහි හවුල්කරුවෙකි. තවද, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ පාලක කමිටුවේ සාමාජිකයෙකු ලෙසද කටයුතු කරයි. මොහු ශ්‍රී ලංකාවේ සමාගම් බොහෝමයක විගණන කමිටුවල සාමාජිකයෙකු වශයෙන් සේවය කරන අතර ස්වාධීන අධ්‍යක්ෂකවරයෙකු වශයෙන්ද සේවය කර තිබේ. ඔහු වර්තමානයේ, ආයෝජන මණ්ඩලයේ කිරි කර්මාන්තය සංවර්ධනය සඳහා වූ මෙහෙයුම් බලකායේ සාමාජිකයෙකු ද වෙයි.

**ඩී.කේ. හෙට්ටිආරච්චි** - *LLB, නීතිඥ*

නීතිඥවරයෙකු හා කොළඹ සරසවියේ නීතිවේදී උපාධිධරයෙකුද වන හෙට්ටිආරච්චි මහතා සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් තනතුර හොබවයි. මොහු සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ වසර 24 ට වඩා වැඩි කාලයක් සේවය කරන ලද අතර, එහි රෙජිස්ට්‍රාර් තනතුරෙහි 1997 සිට සේවය කරයි. මොහු ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ නිල බලයෙන් පත්වූ සාමාජිකයෙකුද වෙයි.

**කේ.එස්.ටී.එස්. ජයසූරිය මිය** - *ACA*

මෙතුමිය කොළඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය අධිකාරී තනතුර හොබවන්නීය. ඊට ප්‍රථම විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විගණන අධීක්ෂකවරියක ලෙස සේවය කර ඇත. ඇය ඉන්දියාවේදී හා එක්සත් රාජධානියේදී ලත් පුහුණුවීම් හා රාජ්‍ය අංශයේ සේවය කිරීමෙන් ලත් නිපුණත්වයෙන්ද පරිපූර්ණය.

**සී.එල්.කේ.පී. ජයසූරිය** - *FCMA (UK), FCCA*

ජයසූරිය මහතා, සී/ස ෆින්ලේස් කලම්බෝ හි සභාපතිවරයා මෙන්ම කළමනාකරණ අධ්‍යක්ෂකවරයාද වෙයි. මොහු වෙළඳ සේවක අර්ථසාධක සංගමයේ සභාපති, ලංකා සේවක සංගමයේ හිටපු සභාපති, එක්සත් රාජධානියේ කළමනාකරණ ගණකාධිකාරීන්ගේ වරලත් ආයතනයේ ශ්‍රී ලංකා අංශයේ පාලක මණ්ඩලයේ සාමාජිකයෙකු හා ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයේ කමිටු සාමාජිකයෙකුද වෙයි.

**ඩී.ටී.එස්.එච්. මුදලිගේ** - *FCA, FCMA (UK), FCCA, FCPA*

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හිටපු සභාපති වන මුදලිගේ මහතා, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතන කවුන්සිලයේ 1997 සිට සේවය කරයි. මොහු ප්‍රයිස්වෝටර්හවුස්කූපර්ස්හි හවුල්කරුවෙකි. මොහු මෙරට සහ පිටරට විශාල ලැයිස්තුගත පොදු සමාගම්වල සේවය කිරීමෙන් ලත් පුළුල් දැනුම් සම්භාරයකින් පරිපූර්ණය. මුදලිගේ මහතා එක්සත් රාජධානියේ කළමනාකරණ ගණකාධිකාරීන්ගේ වරලත් ආයතනයේ ශ්‍රී ලංකා අංශයේ පාලක මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස හා විවිධ නෛතික මණ්ඩල හා ව්‍යවස්ථාපිත කමිටුවල සේවය කරයි.

**එස්. රාජපක්ෂ** - *MBA, FCA*

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ සභාපතිධූරය හොබවන රාජපක්ෂ මහතා බී.ඩී.ඕ පාර්ට්නර්ස්හි කළමනාකරණ හවුල්කරුය. දකුණු ආසියාතික ගණකාධිකරණ සම්මේලනයේ මණ්ඩල සභිකයෙකුද වන මොහු ආසියානු ඒකාබද්ධ ගණකාධිකරණ සම්මේලනයේ තාක්ෂණික උපදේශකවරයා ලෙසද කටයුතු කරයි. එසේම ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති පිළිබඳ උපදේශක කමිටුවේ සාමාජිකයෙකු ලෙසද කටයුතු කරයි.

**එම් සමරසේකර මිය** - *BSc., MPM*

දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් තනතුර දරන සමරසේකර මිය දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වසර 33 ක සේවාකාලයක් සපුරයි. ඇය බදු පරිපාලනයේ විවිධ අංගයන් සම්බන්ධයෙන් ලද විදේශීය පුහුණුවීම්වලින් පරිපූර්ණය.

# මණ්ඩලයේ සාමාජිකයින්

**එන්. සිවප්‍රගාසම් මෙනෙවිය** - *FCA, FCMA (UK)*

මෙතුමිය එයිට්කන් ස්පෙන්ස් සමාගම් සමූහයේ ප්‍රධාන මූල්‍ය නිලධාරිනිය වන අතර, සමූහයේ විවිධ සමාගම්වල අධ්‍යක්ෂක මණ්ඩලයන්හිද කටයුතු කරයි. මෙතුමිය එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ ශ්‍රී ලංකා ශාඛාවේ පාලක මණ්ඩලයේ සාමාජිකාවක වන අතර, විවිධ නෛතික මණ්ඩල හා ව්‍යවස්ථාපිත කමිටුවලද සාමාජිකත්වය දරන්නීය.

**ආර්. ත්‍යාගරාජා** – *MBA (ක්‍රැන්ෆීල්ඩ්) FCA, FCMA (UK)*

ත්‍යාගරාජා මහතා වර්තමානයේ හැටන් නැෂනල් බැංකුවේ කළමනාකාර අධ්‍යක්ෂක/ප්‍රධාන විධායක නිලධාරී තනතුර හොබවන අතර, වර්ෂ 26 ක් ඉක්මවන මෙරට සහ යුරෝපයේ ලත් බැංකු අත්දැකීම්වලින් පරිපූර්ණය. එසේම මොහු මෙම සමාගම් සමූහයේ සමාගම්වල අධ්‍යක්ෂක මණ්ඩලවලද සාමාජිකත්ව දරයි.

මොහු එක්සත් රාජධානියේ කළමනාකරණ ගණකාධිකාරීන්ගේ වරලත් ආයතනයේ ශ්‍රී ලංකා අංශයේ පාලක මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන්ද, විවිධ නෛතික මණ්ඩල, ව්‍යවස්ථාපිත ආයතන හා කමිටුවලද සේවය කරයි.

මොහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ සංගමයේ හා වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමයේ හිටපු සභාපතිවරයෙකුද වන අතර, ආසියානු බැංකුකරුවන්ගේ සංගමයේ සභාපතිධූරය භාරගැනීමට සිටින ප්‍රථම ශ්‍රී ලාංකිකයාද වෙයි.

**ඩබ්.කේ.එච්. වේගපිටිය** - *BSc., MBA*

වේගපිටිය මහතා ලාෆ්ස් හෝල්ඩිංස් සමාගමේ, විධායක සභාපතිවරයා මෙන්ම ආදිකර්තෘද වෙයි. පුළුල් පරාසයක විහිදුනු ව්‍යාපාරික අත්දැකීම් වලට අමතරව ඔහු, ලන්ඩනයේ ඔක්ස්ෆර්ඩ් සරසවියේ බලශක්ති පාසැලෙන්, බලශක්ති කලමනාකරණය පිළිබඳව පාඨමාලාවක්ද හදාරා ඇත. මෙතුමා 2006 වර්ෂයේදී වසරේ ව්‍යවසායකයා ලෙස ප්ලැටිනම් සම්මානයෙන්ද, ඉන්දියාවේ දී පැවති ආසියානු අවබෝධතා නායකත්ව සංවිධානය විසින් මෙහෙයවූ ව්‍යවසායකත්ව විශිෂ්ඨතා - 2007 දී, නිපුණතාවය සඳහා වූ ආසියානු නායකත්ව සම්මානයෙන්ද පිදුම් ලැබීය.

**ඒ.එස්. රත්නායක** - *FCA, FCMA (UK), ACCA, CMA, FCMI, FCMA,CGMA*

*අධ්‍යක්‍ෂ ජනරාල්/මණ්ඩලයේ ලේකම්*

රත්නායක මහතා වර්ෂ 1998 දී මණ්ඩලයේ පළමු අධ්‍යක්ෂ ජනරාල් ලෙස පත් විය. මොහු වරලත් ගණකාධිකරණ අවසන් අදියරේ හා පශ්චාත් උපාධි මට්ටමේ ත්‍යාගලාභියෙකි. එසේම මොහුගේ වෘත්තිය තුළ දේශීය සහ විදේශීය ගණකාධිකරණ ක්‍ෂේත්‍රයන් සඳහා ක්‍රියාකාරී දායකත්වය සපයා ඇත. රත්නායක මහතා, දේශීය සහ බහුජාතික පෞද්ගලික සමාගම්වල ප්‍රධාන විධායක නිලධාරී හා ප්‍රධාන මූල්‍ය නිලධාරී යන තනතුරු දරා ඇති අතර, එම සමාගම්වල අධ්‍යක්‍ෂකවරයෙකු ලෙසද සේවය කර ඇත.

# වර්ෂයේ සමාලෝචනය

## 1. හැඳින්වීම

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය (මණ්ඩලය), 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත මගින් සංස්ථාපනය කරන ලදී. පනතේ සඳහන් නිර්වචන සහ මිනුම් දණ්ඩයන්ට අනුකූලව ඇතැම් ව්‍යවසායයන්, (පිටු අංක 25 බලන්න) නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් ලෙස හඳුන්වා ඇත. මෙම ව්‍යවසායයන් ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළයුතු අතර, ඒවායේ විගණකවරුන්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව කටයුතු කළයුතු වේ. පනතට අනුව, මෙම ව්‍යවසායයන්ගේ වාර්ෂික විගණනය කළ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූල බවට අධීක්ෂණය කිරීම සඳහා මණ්ඩලය වෙත ඉදිරිපත් කළයුතු වේ. මණ්ඩලයේ කාර්යයභාරයන් වන්නේ මණ්ඩලය වෙත ලැබුණු මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම, විගණන සමාලෝචනය කිරීම, ප්‍රමිතීන්ට අනුකූලවීමට අපොහොසත් වීම් විමර්ශනය කිරීම සහ ව්‍යවසායයන් සහ විගණකවරුන් අනුකූල කරවීමට අදාළ නිවැරදි කිරීම් කරවීමට පියවර ගැනීමයි.
මෙම කාර්යය පහසු කිරීම පිණිස, මණ්ඩලය විසින් ප්‍රමිති සම්මත කිරීම පිණිස ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරින්ගේ ආයතනයට වාර්ෂික ප්‍රදානයක් වශයෙන් මූල්‍ය ආධාර සපයනු ලබන අතර, අදාළ ජාත්‍යන්තර ආයතන සමගද සම්බන්ධතා පවත්වනු ලැබේ. ව්‍යවස්ථාපිත කාර්යයන් ඉටු කිරීම සඳහා මණ්ඩලය විසින් කරගෙන යන මෙහෙයයන් හා ක්‍රියාකාරකම් පිළිබඳ සංක්ෂිප්ත විස්තරයක් පහත දැක්වේ.

## 2. මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම

**2.1** මණ්ඩලය විසින් 2011 දෙසැම්බර් 31 දිනට ආයතන 1,256 ක් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් ලෙස හඳුනාගෙන තිබුණි. වර්ෂය තුළදී නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 1,195 ක මූල්‍ය ප්‍රකාශන 1,716 ක් මණ්ඩලය වෙත ලැබී තිබුණ අතර, මණ්ඩලය විසින් නියැදි පදනම මත තෝරාගත් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 195 ක ගේ මූල්‍ය ප්‍රකාශන 213 ක සමාලෝචන නිම කරන ලදී. මෙම නියැදිය, අදාළ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්ගේ සමාලෝචනවල වැදගත් භාවය අනුව විවිධ ප්‍රභේදයන්ට අදාළ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්ගෙන් සමන්විත විය. පෙර වසරේදී මණ්ඩලය විසින් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 209 ක ගේ මූල්‍ය ප්‍රකාශන 211 ක සමාලෝචන නිම කරන ලදී.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවලට අනුකූල නොවීම හේතුවෙන් තම මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය ක්‍රියාකාරකම් බොහෝ සෙයින් වෙනස් කළ නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 9 ක් හඳුනාගන්නා ලදී. එක් රාජ්‍ය සංස්ථාවක් විසින්, විශ්‍රාමික සහ සමාජ ආරක්ෂක ප්‍රතිලාභවල ආයුගණක ඇගයීම් සම්බන්ධව රු. බිලියන 40 ක වෙන් කිරීමක් කරනු ලැබීම සඳහා එකඟතාවක් ලබා දුන් අතර වෙනත් රාජ්‍ය සංස්ථාවන්ගේ මූල්‍ය ප්‍රකාශනයන්හි ශුද්ධ ලාභය/වත්කම් වල අගය රු. මිලියන 253 ක වෙනස්වීම් සම්බන්ධව නිවැරදි කිරීම් සඳහා අදාළ සංස්ථාවන්හි එකඟතාවන් ලබා ගන්නා ලදී. තවද, පෞද්ගලික අංශයේ ලැයිස්තුගත සමාගම්වල මූල්‍ය ප්‍රකාශයන්හි ශුද්ධ ලාභය/වත්කම්වල අගය වෙනස්වීම සම්බන්ධව ලබාගත් එකඟතාවන්වල අගය රු. බිලියන 1.2 ක් විය. (2011 වසර තුළ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයේ සොයා ගැනීම් සඳහා 8 පිටුව සහ 2011 වසර තුළ රාජ්‍ය සංස්ථා සහ ලැයිස්තුගත සමාගම්වලින් ලබාගත් එකඟතාවන් සඳහා 9 පිටුව බලන්න.) මෙම එකඟතාවන්ට අනුකූලව ඊළඟ වසරේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇත්දැයි ඉදිරියේදී සොයා බලනු ලැබේ.

**2.2** වටිනාකමින් වැදගත් වූ නමුත් නීතිමය නියමයන් මාර්ගයෙන් ක්‍රියාකිරීමට තරම් ප්‍රමාණවත් නොවූ ආකාරයේ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවලට අනුකූල නොවූ අවස්ථාවන්හි, එම අනුකූල නොවීම් උපකාරක ලිපි මගින් දන්වනු ලැබේ. වර්ෂය තුළ මෙවැනි උපකාරක ලිපි 56 ක් නිකුත් කර තිබේ.

## 3. විගණන සමාලෝචනය

වර්ෂය තුළදී මණ්ඩලය විසින්, ක්‍රියාකාරී ගණකාධිකරණ ආයතන 17 ක් විසින් සිදු කරන ලද විගණන 30 ක සමාලෝචන නිමකරන ලදී. එයට සාපේක්ෂව පෙර වර්ෂයේදී, විගණන ආයතන 16 ක් විසින් සිදුකරන ලද විගණන 30 ක සමාලෝචන නිමකරන ලදී. කරනලද සමාලෝචන වලින් ආයතන 14 ක් මගින් සිදුකළ විගණන 19 ක අඩුපාඩු හඳුනාගත් අතර, වැදගත් බවින් යුතු සොයා ගැනීම් සම්බන්ධව අදාළ විගණන ආයතන දැනුවත් කරන ලදී. (විගණන සමාලෝචනවල සොයා ගැනීම් සඳහා 11 පිටුව බලන්න).

## 4. විමර්ශන

**4.1** සීමාසහිත ටච්වුඩ් සමාගම, මණ්ඩලය විසින් නිකුත්කරන ලද මාධ්‍ය ප්‍රකාශනයේ සඳහන් තීරණය ඉවතලීම පිණිස අභියාචනා අධිකරණයෙන් අයැදුම් කර තිබුණ අතර, අභියාචනා අධිකරණය එම ඉල්ලීමට අවසරදී ඇත. අභියාචනා අධිකරණයේ එම තීන්දුවට එරෙහිව අභියාචනයක් ඉදිරිපත් කිරීම පිණිස ශ්‍රේෂ්ඨාධිකරණය විසින් මණ්ඩලය වෙත විශේෂ අවසරයක් ලබා දෙන ලදි. ශ්‍රේෂ්ඨාධිකරණයට කළ එම අභියාචනය සම්බන්ධව වසර අවසානය දක්වා තීන්දුවක් ගෙන නොතිබින.

## 5. ප්‍රමිති ස්ථාපනය කිරීමට දැක්වූ සහයෝගය

**5.1** මණ්ඩලය, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට රු. මිලියන 2.5 ක ප්‍රදානයක් මේ වසර තුළද ලබාදී තිබේ. මෙම ප්‍රදාන, ප්‍රමිති ස්ථාපනයට අදාළ කාර්යයන්ට සහ ගිණුම් ප්‍රමිති කමිටුවේ සහ විගණන ප්‍රමිති කමිටුවේ කටයුතුවලට දායක වීමෙන් තත්ත්වයෙන් ඉහළ ප්‍රමිති ස්ථාපනයට ඉවහල්වී මණ්ඩලයේ කාර්යභාරය නිවැරදිව ඉටු කිරීමට පිටුවහලක්වී තිබේ.

# වර්ෂයේ සමාලෝචනය

**5.2** ගිණුම් හා විගණන ප්‍රමිතිවල සංශෝධන සම්බන්ධයෙන් වර්ෂය තුළ ක්‍රියාත්මකවූ මූලික ක්‍රියාකාරකම් නම් -

- ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (IFRS) ගේ 2009 බැඳි වෙළුම මත පදනම් වූ 2012 ජනවාරි 1 දින හෝ ඊට පසුව ආරම්භ වන කාලපරිච්ඡේද අනාවරණය කෙරෙන මූල්‍ය ප්‍රකාශනවලට බලාත්මක වන SLFRS සහ LKAS ලෙස පූර්ව ප්‍රතිෂ්ඨාපනය කර ඇති සම්පූර්ණ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති කට්ටලය ගැසට් කිරීම සහ ප්‍රකාශනය කිරීම.
- SLFRS ලෙස පූර්ව ප්‍රතිෂ්ඨාපනය කර ඇති 2013 ජනවාරි 1 දින හෝ ඊට පසුව ආරම්භවන කාලපරිච්ඡේද අනාවරණය කෙරෙන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති 3 ක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතන කවුන්සලය මගින් අනුමත කර ගැසට් කිරීම සඳහා සැලසුම් කිරීම.
- 2012 ජනවාරි 1 දිනට හෝ ඊට පසුව ආරම්භවන කාලපරිච්ඡේද සඳහා අදාළ වන කුඩා හා මධ්‍ය පරිමාන ව්‍යවසායයන් (SME) සඳහා වන ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිය ගැසට් කිරීම සඳහා යොමු කිරීම.
- පැහැදිලි කිරීමේ ව්‍යාපෘතිය යටතේ ජාත්‍යන්තර විගණනය සහ තත්ත්ව පාලන ප්‍රමිති අත්පොතේ 2009 වෙළුම මත පදනම් වී සංශෝධනය කෙරෙමින් පැවතුන ශ්‍රී ලංකා විගණන ප්‍රමිති 30 ක සහ තත්ත්ව පාලන 1 (SLSQC1) ට අදාළ ශ්‍රී ලංකා ප්‍රමිතියේ සංශෝධන ක්‍රියාවලිය අවසන් විය. මෙම ප්‍රමිතීන් ඉදිරියේදී ගැසට් කිරීමට නියමිතව ඇත.

## 6. ජාත්‍යන්තර සබැඳියාවන්

**6.1** මණ්ඩලයට, ජාත්‍යන්තර සංවිධානවල සාමාජිකත්ව ඉසිලීම මගින්, ගිණුම් වාර්තාකරණය, විගණනය සහ ප්‍රමිතීන්ට අනුකූලවීම් සමාලෝචනය යන කාර්යයන්හි ගෝලීය වර්ධනය සම්බන්ධව මනා දැනුමක් ලැබී තිබේ. තවද, එමගින් වෙනත් නියාමන ආයතන සමග තොරතුරු හුවමාරු කිරීමට සහ නියාමන ආයතන සමග සාමූහිකව කටයුතු කිරීමේ ක්‍රියාවලීන්හි නිරතවීමට මග පෑදෙනු ඇත. වර්ෂය තුළ පහත සඳහන් ජාත්‍යන්තර ආයතනවල සාමාජිකත්වය පවත්වා ගෙන යන ලදි:

- ස්වාධීන විගණන නියාමකයන්ගේ ජාත්‍යන්තර සංසදය (IFIAR) - මණ්ඩලය විසින් 2007 පැවති ප්‍රථම නිල හමුවේ පටන් සාමාජිකත්වය දරණු ලැබේ.
- ජාත්‍යන්තර විගණන හා සහතික කිරීමේ ප්‍රමිති මණ්ඩලයේ (IAASB) උපදේශක හා නිර්දේශක කණ්ඩායම - මණ්ඩලයට 2007 දී සාමාජිකත්වය හිමි වී ඇත.
- ගණකාධිකාරීන් සඳහා වන ජාත්‍යන්තර ආචාර ධර්ම ප්‍රමිති මණ්ඩලයේ (IESBA) උපදේශක හා නිර්දේශක කණ්ඩායම - මණ්ඩලයට 2009 දී සාමාජිකත්වය හිමි විය.
- ජාත්‍යන්තර තක්සේරු ප්‍රමිති කමිටුව (IVSC) - මණ්ඩලයට 2008 දී සාමාජිකත්වය හිමි විය.

**6.2** ශ්‍රී ලංකාව, 2009-2011 වර්ෂ සඳහා ගිණුම් හා වාර්තාකරණ ප්‍රමිති සඳහා වන අන්තර්රාජ්‍ය කාර්ය සාධන කණ්ඩායමේ (ISAR) සාමාජිකත්වයට නැවත පත්කරනු ලැබීය. මණ්ඩලයේ සේවකයින් විසින් ISAR හි දී ශ්‍රී ලංකාව නියෝජනය කරනු ලැබේ.

**6.3** මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්, ජාත්‍යන්තර තක්සේරු ප්‍රමිති කමිටුවේ (IVSC) වාණිජ වන කළමනාකරණ ව්‍යාපෘතියේ සාමාජිකයෙකු ලෙස සේවය කළේය.

## 7. ජනතාව දැනුවත් කිරීමට ගත් පියවර

**7.1** මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම් අනුව පිළියෙළ නොකිරීම නිසා මූල්‍ය තත්ත්වය සහ මූල්‍ය ක්‍රියාකාරකම්හි අගය නිවැරදි කළ යුතු නමුත් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට තරම් ප්‍රමාණවත් නොවූ අනුකූල නොවීම් සහ හඳුනාගත් ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලින් වූ බැහැරවීම් සඳහන් විස්තර පත්‍රිකාවක් සියළුම නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් වෙත මෙම වසර තුළ බෙදා හරින ලදී.

**7.2** මණ්ඩලය වෙත විගණනය කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ නීතිමය අවශ්‍යතාව විස්තර කෙරෙන ලිපියක් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් 2,373 කට බෙදා හැරීමට පියවර ගන්නා ලදී.

**7.3** මණ්ඩලය වෙත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ව්‍යවස්ථාපිත අවශ්‍යතාව සඳහන් පුවත්පත් දැන්වීම් පෙළක් පළ කරන ලදී.

## 8. සමාලෝචන මඩුල්ල

මණ්ඩලය විසින් සමාලෝචනය කරන ලද මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව ඉහළ නැංවීමේ පියවරක් ලෙස සමලෝචන මඩුල්ලක් පත් කර ගන්නා ලදී. 2011 අගෝස්තු මස සිට, 15 දෙනෙකුගෙන් සමන්විතවූ එම මඩුල්ල විසින්, මූල්‍ය ප්‍රකාශන 170 ක මූලික සමාලෝචන නිම කරන ලදී. එම සමාලෝචන සම්පූර්ණ කිරීම සඳහා මණ්ඩයේ තාක්ෂණික නිලධාරීන්, එම සාමාලෝචකයන් සොයාගත් කරුණු පරීක්ෂා කිරීම, තාක්ෂණික කමිටුව සමග සොයා ගැනීම් සාකච්ඡා කිරීම සහ අදාළ අතිරේක තොරතුරු ලබා ගැනීම ආදිය කළ යුතු වේ. මණ්ඩලයේ තාක්ෂණික නිලධාරීන්, වසර තුළ සමාලෝචකයන් විසින් මූලික සමාලෝචන නිමකරන ලද මූල්‍ය ප්‍රකාශන 97 ක සමාලෝචන සම්පූර්ණ කරන ලදී.

## 9. මානව සම්පත් සංවර්ධනය

**9.1** 2011 වර්ෂය අවසානය වන විට මණ්ඩලය සේවකයින් 11 දෙනෙකුගෙන් සමන්විත වූ අතර, එයින් 6 දෙනෙක් වරලත් ගණකාධිකාරීහු වූහ. මෙතෙක් කල් සේවක පිරිස වැඩි කිරීමට මණ්ඩලයට නොහැකි වූයේ සේවක වේතන සම්බන්ධ රාජ්‍ය චක්‍රලේඛ හේතුවෙන් වෙළඳපළ පදනම් වූ වැටුප් තලයන් පවත්වා ගෙන යාම පිණිස පැවති බාධකයයි. එනමුත්, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවෙන් යෝජනා කර ඇති පරිදි ගිවිසගත් වැටුප් තලයන් මත කොන්ත්‍රාත් පදනම මත වෘත්තිකයන් බඳවා ගැනීමට මහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලැබී තිබුණි. කෙසේ වෙතත් මහා භාණ්ඩාගාරය විසින් සේවක පිරිස වැඩි කිරීම සඳහා අනුමැතිය ලබා දීමේදී, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ යෝජනාවන් සම්බන්ධයෙන් පැනවූ සීමාවන් හේතුවෙන් වර්ෂය තුළද පැවති පුරප්පාඩු පිරවීමට නොහැකි විය.

**9.2** තාක්ෂණික කාර්ය මණ්ඩලයට මූල්‍ය වාර්තාකරණය, විගණනය සහ නියාමනය සම්බන්ධ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ, වැඩමුළු සහ පුහුණු කිරීමේ වැඩසටහන් වලට සහභාගීවීමේ අවස්ථා 6 ක් මෙම වර්ෂය තුළ දී උදාවිය.

## 10. පාලන පටිපාටිය

**10.1** මණ්ඩලය නිල බලයෙන් පත්වූ සාමාජිකයන් 3 දෙනෙකුගෙන් සහ මුදල් හා ක්‍රම සම්පාදන ඇමතිතුමා විසින් පත් කළ සාමාජිකයින් 10 දෙනෙකුගෙන් සමන්විත වෙයි. සමාගම් රෙජිස්ට්‍රාර්වරයා, දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා සහ ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා 'නිල බලයෙන් පත්වූ' සාමාජිකයෝ වෙති. 'පත් කළ' සාමාජිකයෝ පහත සඳහන් ආයතන නියෝජනය කරති:

- ශ්‍රී ලංකා මහ බැංකුව
- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය (සාමාජිකයින් 3)
- එක්සත් රාජධානියේ කළමනාකරණ ගණකාධිකාරීන්ගේ වරලත් ආයතනයේ ශ්‍රී ලංකා අංශය
- ශ්‍රී ලංකා නීතිඥ සංගමය
- ලංකා වාණිජ මණ්ඩලය
- ශ්‍රී ලංකා කර්මාන්ත, වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය
- ශ්‍රී ලංකා බැංකු සම්මේලනය
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

**10.2** ශ්‍රී ලංකා මහ බැංකුවේ සහකාර අධිපතිවරයකු වන පී. සමරසිරි මහතා වර්ෂය තුළ සභාපති ලෙස කටයුතු කළේය.

**10.3** වර්ෂය තුළ මණ්ඩලයේ රැස්වීම් 8 ක් පවත්වන ලදී.

**10.4** වර්ෂය තුළ මණ්ඩලයේ සාකච්ඡාවන්ට සමස්ත උපදේශනය, ප්‍රතිපත්ති සම්බන්ධ තීරණ, මූල්‍ය ප්‍රකාශන අනුමත කිරීම, වාර්ෂික අයවැය ලේඛනය අනුමත කිරීම සහ මණ්ඩලයේ තාක්ෂණික ධාරිතාව වැඩි කිරීමේ මාර්ග සෙවීම ආදිය ඇතුළත් විය.

**10.5** මණ්ඩලයේ වැඩ පැවරීමේ ප්‍රතිපත්තියට අනුරූපව නිත්‍ය ක්‍රියාවලියන් වන ප්‍රමිතීන්ට අනුකූලවීම් සමීක්ෂණයට අදාළ තොරතුරු එක්රැස් කිරීම, මූල්‍ය ප්‍රකාශන සහ විගණන සමාලෝචනය සහ විමර්ශනයන්, එහි නිලධාරීන් විසින් ක්‍රියාත්මක කරන ලද අතර, එම කටයුතු සිදු කෙරුනේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අධීක්ෂණය සහ උපදේශකත්වය යටතේය.

## 11. වෙනත් ක්‍රියාකාරකම්

මණ්ඩලය වෙත ලැබෙන මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව ඉහළ ගිය බැවින් මණ්ඩලය විසින් ඒවා ස්කෑන් කර සංරක්ෂණය කිරීම සඳහා කටයුතු ආරම්භ කරන ලදී.

## 12. මූල්‍ය ක්‍රියාකාරකම්

**12.1** වර්ෂයේ මෙහෙයුම් වියදම් රු. 34,735,135/- ක් වූ අතර, පෙර වර්ෂයේ වියදම් රු. 28,533,932/- ක් විය. වර්ෂයේ මෙහෙයුම් වියදම් වල වැඩිවීම 22% ක් විය.

**12.2** පෙර වර්ෂයේ කාර්ය මණ්ඩල පිරිවැය වූ රු. 11,957,572/- ට සාපේක්ෂව වර්ෂය තුළ පිරිවැය රු. 13,669,810/- ක් විය. එය 14% ක වැඩිවීමකි. කාර්ය මණ්ඩල පිරිවැය මණ්ඩලයේ මෙහෙයුම් වියදම් වලින් 39% ක් විය.

**12.3** මූල්‍ය වාර්තා සමාලෝචනය සඳහා ගෙවූ වෘත්තීයමය ගාස්තු, කාර්ය මණ්ඩල වේතනවල වැඩිවීම, නව තාක්ෂණික කළමනාකාරවරයෙකු පත් කිරීම හා වැඩි පුවත්පත් දැන්වීම් ප්‍රමාණයක් පලකිරීම මෙලෙස වියදම් ඉහළයාමට හේතු විය. මෙම වියදම් සඳහා මූල්‍ය සම්පාදන රාජ්‍ය ප්‍රදාන මගින් කරනු ලැබීය.

# 2011 වසර තුළ මූල්‍ය ප්‍රකාශන සමාලෝචනයේ සොයා ගැනීම්

## 1. නිවැරදි කිරීම් සඳහා එකඟතාවන් ලබා ගැනීම

2011 වර්ෂය තුළ ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය විසින් (SLAASMB) නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් නවයක ගෙන් එම ව්‍යවසායයන්ගේ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි කිරීම් සඳහා එකඟතාවන් ලබා ගන්නා ලදී.

එක් රාජ්‍ය සංස්ථාවක් විසින් විශ්‍රාමික සහ සමාජ ආරක්ෂක ප්‍රතිලාභ වල ආයුගණක ඇගයීම් සම්බන්ධව රු. බිලියන 40 ක වෙන් කිරීමක් සිදු කිරීම සඳහා එකඟතාවක් ලබා දෙන ලද අතර, වෙනත් රාජ්‍ය සංස්ථා වල මූල්‍ය ප්‍රකාශයන්හි ශුද්ධ ලාභය/වත්කම් වල අගය රු. මිලියන 253 ක වෙනස් වීම් සම්බන්ධව නිවැරදි කිරීම් සඳහා අදාළ සංස්ථාවන් ගෙන් එකඟතාවන් ලබා ගන්නා ලදී. තවද, පෞද්ගලික අංශයේ ලැයිස්තුගත සමාගම්වල මූල්‍ය ප්‍රකාශයන්හි ශුද්ධ ලාභය/වත්කම්වල අගය වෙනස්වීම සම්බන්ධව ලබාගත් එකඟතාවන්හි මුළු අගය රු. බිලියන 1.2 විය.

එසේ එකඟතාවන් ලබා ගන්නා ලද අයිතමයන්ගේ ස්වරූපය පහත දැක්වේ:

- අඩමාන ණය සඳහා වෙන් නොකිරීම.
- දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනයේදී යෝග්‍ය නොවන අතිරික්ත වටිනාකමක් සාධාරණ අගය ලෙස හඳුනාගෙන එම අතිරික්තය ප්‍රසාද කොටස් නිකුතුවක් සඳහා යොදා ගැනීම.
- ප්‍රත්‍යාගණන ආකෘතිය මත දේපල, පිරියත හා උපකරණ හඳුනාගන්නා විට එහි ධාරණ අගය, ශේෂ පත්‍ර දිනටවූ සාධාරණ වටිනාකම අනුව නිශ්චය කරන අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස් නොවන පරිදි, ප්‍රමාණවත් විධිමත් බවකින් යුතුව ප්‍රත්‍යාගණනය නොකිරීම.
- වත්කමක්, ප්‍රමිතියේ නිර්වචනයට අනුව කෘෂිකාර්මික කටයුත්තකට සම්බන්ධ නොවන අවස්ථාවක, එය ජීවවිද්‍යාත්මක වත්කමක් ලෙස සලකා එහි සාධාරණ අගය වෙනස් වීමෙන්වූ ලාභය, ආදායමක් ලෙස හඳුනාගැනීම.
- වත්කම් වලට සම්බන්ධ රාජ්‍ය ප්‍රදාන, විලම්බිත ආදායමක් ලෙස හෝ වත්කමෙහි ධාරණ අගයට එළැඹීමේදී අඩුකර හෝ දැක්වීමට අපොහොසත් වීම.
- පරිපාලිත සමාගමක හිමිකම වෙනස් වීමෙන්වූ ලාභය වැරදි ලෙස ගණනය කිරීම.

## 2. උපකාරක ලිපි

වටිනාකමින් වැදගත්වූ නමුත් නීතිමය නියමයන් මාර්ගයෙන් ක්‍රියාකිරීමට තරම් ප්‍රමාණවත් නොවූ ආකාරයේ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති වලට අනුකූල නොවූ අවස්ථාවල, එය දීර්ඝ ලෙස විමර්ෂණය නොකර, අදාළ ව්‍යවසායයන්ට ස්ව කැමැත්තෙන් ඒ සඳහා නිවැරදි පියවර ගතහැකි වන පරිදි ලිපි මගින් දැනුම් දෙන ලදී. එම ලිපි, මණ්ඩලය විසින් නිකුත් කළ නියමයන් නොවන අතර, ඒවා නිකුත් කිරීමේ අභිප්‍රාය උපකාරක ලිපි වශයෙන් වේ.

**උපකාරක ලිපි නිකුත් කිරීමට හේතුවූ මූලික සොයා ගැනීම් පහත දැක්වේ:**

- සේවක පාරිතෝෂික සඳහා වන වගකීමේ වර්තමාන වටිනාකම ගණනය කිරීම සඳහා ප්‍රමිතියට අනුකූලව ප්‍රක්ෂේපිත ඒකක බැර ක්‍රමය යොදා නොගැනීම.
- අඩමාන ණය සඳහා වෙන් නොකිරීම.
- බදු වන තාවකාලික විෂමතාවන් සඳහා විලම්බිත බදු වගකීම් හඳුනා නොගැනීම.
- ප්‍රත්‍යාගණන ආකෘතිය යොදා ගැනීමේදී, දේපල, පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය විධිමත්ව නොකිරීම.
- ප්‍රත්‍යාගණනය කරන ලද වත්කමට අදාළ වන මුළු දේපල, පිරියත හා උපකරණ බාණ්ඩයම ප්‍රත්‍යාගණනය නොකිරීම.
- එකම ආකාරයේ ගනුදෙනු සහ එක හා සමාන තත්ත්වයන් යටතේ වූ අනෙකුත් සිදුවීම් සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී, ඒකාකාර ගිණුම් ප්‍රතිපත්ති යොදා නොගැනීම.
- බදු කුලී ඉපැයීමට හෝ ප්‍රාග්ධන වටිනාකම වැඩිවීම සඳහා තබා ඇති දේපල ආයෝජන දේපල ලෙස හඳුනා නොගැනීම.
- ආයෝජන වල අගය අඩුවීම හඳුනා ගැනීමට අපොහොසත් වීම.

# 2011 වසර තුළ රාජ්‍ය සංස්ථා සහ ලැයිස්තුගත සමාගම්වලින් ලබාගත් එකඟතාවන්

## 1. කෘෂිකාර්මික හා ගොවිජන රක්‍ෂණ මණ්ඩලය

රාජ්‍ය සංස්ථාවක් වන කෘෂිකාර්මික හා ගොවිජන රක්‍ෂණ මණ්ඩලය, එහි 2009 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ගොවි විශ්‍රාමික සහ සමාජ ආරක්‍ෂණ ප්‍රතිලාභවල ආයුගණක ඇගයීම් සඳහා රු. බිලියන 40 ක වෙන් කිරීමක් කර නොතිබුනි. එම මණ්ඩලයේ විගණකවරුන් මේ සම්බන්ධව තත්ත්වාගණනය කළ මතයක් ඉදිරිපත් කර නොතිබුනි.

මණ්ඩලය විසින් කරන ලද පරීක්‍ෂණයේ ප්‍රතිඵලයක් ලෙස එම සංස්ථාව විසින් 2011 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන වල අදාළ ගැලපීම් කිරීමට එකඟ වන ලදී.

## 2. සීමාසහිත කලම්බෝ ෆෝට් ලෑන්ඩ් ඇන්ඩ් බිල්ඩිං සමාගම

ලැයිස්තුගත සමාගමක් වන සීමාසහිත කලම්බෝ ෆෝට් ලෑන්ඩ් ඇන්ඩ් බිල්ඩිං සමාගම, 2007 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී දේපල පිරියත හා උපකරණ සඳහා ප්‍රත්‍යාගණන ප්‍රතිපත්තිය තෝරාගෙන තිබිණි. ඒ අනුව ඉඩම් හා ගොඩනැගිලි හඳුනාගෙන තිබුණේ 1980 ප්‍රත්‍යාගණන වටිනාකම අනුවය. එහෙත් ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති අනුව ප්‍රත්‍යාගණන කිරීමේදී, එහි ධාරණ අගය, ශේෂ පත්‍ර දිනට වූ සාධාරණ වටිනාකම භාවිතා කරමින්, නිශ්චය කරන අගයෙන් ප්‍රමාණාත්මක ලෙස වෙනස් නොවන පරිදි, ප්‍රමාණවත් විධිමත් බවකින් යුතුව ප්‍රත්‍යාගණනය කළ යුතුය. විගණකවරුන්ද මේ සම්බන්ධව තත්ත්වාගණනය කළ මතයක් ඉදිරිපත් කර නොතිබුණි. මණ්ඩලයේ පරීක්‍ෂණවල ප්‍රතිඵලයක් ලෙස සමාගම විසින් මෑතකදී කරන ලද ප්‍රත්‍යාගණන වටිනාකමක් මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගැනීමට එකඟ විය. ඒ අනුව ශුද්ධ වත්කම් රු. මිලියන 652 කින් වැඩි වේ.

## 3. සීමාසහිත පැල්වත්ත සීනි සමාගම

2010 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ සීමාසහිත පැල්වත්ත සීනි සමාගමේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල පරිපාලිත සමාගමේ පිරියත හා උපකරණවල අගය රු. මිලියන 461 කින් අධිතක්සේරු කර තිබුණි. මේ සම්බන්ධයෙන් විගණකවරයාගේ වාර්තාව විකරණය කර නොතිබුනි.

මණ්ඩලයේ පරීක්‍ෂණ හේතුවෙන් සමාගම විසින් 2011 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වල එම අධිතක්සේරුව ප්‍රතිවර්තනය කිරීමට එකඟ වී ඇත.

ප්‍රතිවර්තනය නිසා සමූහ රඳවාගත් ඉපැයීම් රු. මිලියන 230 කින්ද සුළු කොටස්හිමියන්ගේ අයිතිය රු. මිලියන 230 කින්ද අඩුවේ.

## 4. සීමාසහිත කොකෝ ලංකා සමාගම

ලැයිස්තුගත සමාගමක් වන සීමාසහිත කොකෝ ලංකා සමාගමේ 2010 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල, පරිපාලිත සමාගමක අයිතිය වෙනස් වීමෙන්වූ ලාභය හඳුනාගෙන ඇත්තේ යෝග්‍ය නොවන ගණනය කිරීමක් පදනම් කරගෙනය. ඒ සම්බන්ධව විගණකවරු තත්ත්වාගණනය කළ මතයක් ඉදිරිපත් කර නොතිබුණි.

මණ්ඩලයේ පරීක්‍ෂණයන්හි ප්‍රතිඵලයක් ලෙස සමාගම විසින් 2011 මාර්තු 31 දිනෙන් අවසන් වූ මූල්‍ය ප්‍රකාශන වල සන්සන්දනාත්මක තොරතුරු වල අවශ්‍ය ගැලපීම් කිරීමට එකඟ විය.

# මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකළ ලැයිස්තුගත සමාගම් සහ රාජ්‍ය සංස්ථා

2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකළ ලැයිස්තුගත සමාගම් -

- වනික් ඉන්කෝපරේෂන් ලිමිටඩ්

2011 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකළ ලැයිස්තුගත සමාගම් -

- ෆර්න් ටී පී.එල්.සී.
- හොටේල් ඩිවෙලපර්ස් පී.එල්.සී.
- මිරමා බීච් හොටේල්ස් පී.එල්.සී.

2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකළ රාජ්‍ය සංස්ථා -

- ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව
- සෙන්ට්‍රල් එන්ජිනියරින් කන්සල්ටන්සි බියුරෝ
- ලංකා විදුලිබල මණ්ඩලය
- ලංකා ධීවර සංස්ථාව*
- ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව*
- පොල් වගා කිරීමේ මණ්ඩලය*
- ජනතා වතු සංවර්ධන මණ්ඩලය
- ලෝහර් ආර්‍යා අරමුදල*
- ශ්‍රී ලංකා ජාතික චිත්‍රපටි සංස්ථාව*
- ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය*
- ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
- වී අලෙවි මණ්ඩලය
- ශ්‍රී ලංකා ආයුර්වේද ඖෂධ සංස්ථාව*
- ශ්‍රී ලංකා කජු සංස්ථාව
- ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
- ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟලුම් ආයතනය*
- ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
- රාජ්‍ය සංවර්ධන සහ ගොඩනැගිලි සංස්ථාව
- ශ්‍රී ලංකා රාජ්‍ය ඉන්ජිනේරු සංස්ථාව
- ශ්‍රී ලංකා ජාතික ඖෂධ නීතිගත සංස්ථාව*
- ශ්‍රී ලංකා රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව*
- කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය*
- සමූපකාර තොග සංස්ථාව

2011 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකළ රාජ්‍ය සංස්ථා -

- ලංකා නැව් සංස්ථාව
- ජාතික කඩදාසි සමාගම
- ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සහ සංවර්ධනය කිරීමේ සංස්ථාව*

***පසුව ඉදිරිපත් කරන ලදි (2012 මැයි 31 දිනට පෙර)***

SLAASMB
ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය

# විගණන සමාලෝචනවල සොයා ගැනීම්

## 1. පසුබිම

2011 වර්ෂය තුළ ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය විසින් විගණන ආයතන 17 ක් විසින් කරන ලද විගණන 30 ක් සමාලෝචනය කරන ලදී. එයින් විගණන 17 ක්, අන්තර්ජාතික ජාලයන්ට අයත් විගණන ආයතන විසින් විගණනය කරන ලද ඒවාය.

## 2. ප්‍රධාන සොයා ගැනීම්

ආයතන 14 ක් විසින් කරන ලද විගණන 19 ක අඩුපාඩුකම් සොයා ගන්නා ලදී. සොයා ගන්නා ලද විගණන ප්‍රමිතීන්ට පටහැනි වීම්, උපකාරක ලිපි වශයෙන් අදාළ ආයතන දැනුවත් කිරීම පිණිස යවන ලදී.

### ප්‍රධාන සොයාගැනීම් පහත සඳහන් වේ:

**2.1 ප්‍රමාණාත්මකව ලේඛනගත නොකළ අයිතම**

විගණන මතය ප්‍රකාශ කිරීමට සාක්ෂි වශයෙන්ද, ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කළ බවට සාක්ෂි වශයෙන්ද, වැදගත් වූ කරුණු ලේඛනගත කිරීමේ අඩුපාඩු විගණන 9 ක විද්‍යමාන විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවල අවශ්‍යතා අනුව ලේඛනගත නොකළ තොරතුරු අයිතම පහත දැක්වේ:

- විගණනයේ ස්වභාවය, ඒ ඒ කාර්යයන් ඉටු කළ අවස්ථාවන්, ඉටු කළ ප්‍රමාණයන් සහ ඒවායේ ප්‍රතිඵල. මින් සමහර අවස්ථාවල විලම්බිත බදු, ලැබිය යුතු මුදල් සහ බදු අලාභ සම්බන්ධයෙන් කරනලද වැඩ පිළිබඳ සාක්ෂි නොපැවතිනි. තවද, නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් මැනීම සඳහා යොදාගත් උපකල්පන සහ හිමිකම් ආයෝජනවලින් ලත් ප්‍රාග්ධන ලාභ පිරික්සීම සඳහා කරන ලද වැඩ සම්බන්ධයෙන් සාක්ෂිද නොතිබිණ.
- විගණනය සැලසුම් කිරීම සහ විගණන වැඩ සටහන.
- ආයතනයට අදාළ වන්නා වූ කර්මාන්තයේ සහ ආර්ථික හා නීතිමය පසුබිම් පිළිබඳ විස්තර.
- ආයතනයේ ගිණුම්කරණ පද්ධතිය හා අභ්‍යන්තර පාලන පද්ධතිය විගණක විසින් අවබෝධ කරගන්නා ලද ආකාරය.
- විගණක විසින් යොදාගෙන තිබෙන නියදිකරණ තාක්ෂණ.
- ගනුදෙනු හා ශේෂ විශ්ලේෂණයන්.
- වැදගත් අනුපාත හා උපනති විශ්ලේෂණයන්.
- හඳුනා ගන්නා ලද සහ තක්සේරු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශ මූල්‍ය ප්‍රකාශන මට්ටමෙහි සහ සැඳැහුම් මට්ටමේදී ඇතුළත් වීමේ අවදානම.
- සහායකයින් විසින් ඉටුකරන ලද වැඩ අධීක්ෂණය කළ බවටත් සමීක්ෂණය කළ බවටත් සාක්ෂි.
- විගණන ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීමේදී ව්‍යතිරේකයන් හෝ අසාමාන්‍ය කරුණු හෙළිදරව්වූයේ නම්, එම කරුණු නිරාකරණය කරගත් හෝ සලකන ලද ආකාරය ඇතුළු වැදගත් විගණන අංශ සම්බන්ධයෙන් එළැඹි නිගමන.

**2.2 ප්‍රමාණවත් අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අපොහොසත්වීම**

විගණන 8 ක ලේඛනගත කිරීම්වල මූල්‍ය ප්‍රකාශන සැඳැහුම් තහවුරු කිරීමේදී, තහවුරු ක්‍රියා පටිපාටිවලින් සහ පාලන පරීක්ෂාවලින් ප්‍රමාණවත් හා යෝග්‍ය විගණන සාක්ෂි ලැබී තිබුණු බවට සටහන් නොතිබිනි.

එම අඩුපාඩු නම් -

- ලැබිය යුතු මුදල්, ගෙවිය යුතු මුදල්, සම්බන්ධිත පාර්ශ්ව අතර ගණුදෙනු සහ අසම්භාව්‍ය වගකීම් සම්බන්ධ මූල්‍ය ප්‍රකාශන සැඳැහුම් පරීක්ෂා කිරීමට විගණන පටිපාටි ක්‍රියාත්මක නොකිරීම.
- පරිපාලිත සමාගම්වල ආයෝජන සහ ලැබිය යුතු මුදල් අයකර ගැනීමේ හැකියාව තහවුරු ක්‍රියා පාටිපාටි මගින් තහවුරු කර ගැනීමට අපහසු වීම.
- තහවුරු ක්‍රියා පටිපාටි අනුගමනය නොකර සමාගම විසින් ඉදිරිපත් කරන ලද තොග සහතිකයක් තොග වටිනාකම තහවුරු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි ලෙස පිළිගැනීම.
- අයකරගත නොහැකි ලෙස හඳුනාගත් ලැබිය යුතු පොලී සහ වරණීය කොටස් ආයෝජන සඳහා ප්‍රමාණවත් වෙන්කිරීම් කර තිබේදැයි තහවුරු කිරීමට ක්‍රියාපටිපාටි අනුගමනය නොකිරීම.
- පරිපාලිත සමාගමක හිමිකම වෙනස්වීමෙන් ලැබූ ලාභය ගණනය කිරීම සත්‍යාපනය නොකිරීම.

**2.3 පාලන අවධානම සම්බන්ධ අවබෝධය සහ තක්සේරුව**

ගිණුම්කරණ හා අභ්‍යන්තර පාලන ක්‍රම සහ පාලන අවධානම සම්බන්ධව විගණක විසින් ලබාගත් අවබෝධය පිළිබඳව තොරතුරු විගණන 6ක ලේඛණගතවී නොතිබිණි.

**2.4 ප්‍රමාණාත්මකභාවය ගොඩනගා ගැනීමට අපොහොසත්වීම**

විගණන පටිපාටිවල ස්වභාවය, කාල නියමය සහ ප්‍රමාණය තීරණය කිරීමේදී හා වැරදි ප්‍රකාශවල බලපෑම ඇගයීමේ දී ප්‍රමාණාත්මකභාවය ගොඩනගා ගැනීම සම්බන්ධ සටහන් විගණන 5 ක නොතිබිණි.

# විගණන සමාලෝචනවල සොයා ගැනීම්

**2.5 විගණන පටිපාටිය පදනම් කිරීමට ප්‍රමාණවත් සැළැහුම් යොදා නොගැනීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශන හඳුනාගැනීමට අපොහොසත් වීම.**

විගණන 4 ක ගනුදෙනු වර්ග, ගිණුම් ශේෂ, ඉදිරිපත් කිරීම් හා හෙළිදරව් කිරීම් සම්බන්ධයෙන් සැළැහුම් ප්‍රමාණවත් අයුරින් යොදා නොගැනීම හේතුවෙන් ප්‍රමාණවත් සාවද්‍ය ප්‍රකාශ ඇතුළත් වීමේ අවදානම මැනීමට සහ තවදුරටත් කළයුතු විගණන පටිපාටි සැලසුම් කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට පදනමක් සකස් කිරීමට අපොහොසත් වී තිබේ. ඒ අනුව හඳුනා ගැනීමට අපොහොසත් වූ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් වූ ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශ පහත දැක්වේ:

- මෙහෙයුම් කල්බදු යටතේ වූ ඉඩමක් ප්‍රත්‍යාගණනය කොට මූල්‍ය කල්බදු ලෙස හඳුනා ගැනීම.
- වැරදි වටිනාකමක් ආයෝජන දේපලවල පිරිවැය ලෙස හඳුනාගැනීම.
- මූල්‍ය සමාගමක මූල්‍ය ප්‍රකාශනවල වැදගත් බව්න් ඉහළ හෙළිදරව් කිරීමක් කර නොතිබීම.
- ආයෝජන සහ ලැබිය යුතු මුදල්වල අගය අඩුවීම හඳුනා නොගැනීම.
- ආශ්‍රිතයන්ගේ ආයෝජන ස්කන්ධ ක්‍රමයට ගිණුම්ගත නොකිරීම.
- ආයෝජන දේපල, දේපල පිරියත හා උපකරණ ලෙස හඳුනාගෙන ඉදිරිපත් කිරීම.

**2.6 සම්බන්ධිත පාර්ශ්ව අතර ගනුදෙනු**

හෙළිදරව් නොකළ සම්බන්ධිත පාර්ශ්ව අතර ගනුදෙනු පැවති වාර්තා මඟින් සමාලෝචනය කර හඳුනා ගැනීමට අපොහොසත්වූ විගණන 4 ක් සොයා ගැණින.

නිදසුන්:

- පරිපාලිත සමාගමක් සමඟ ගනුදෙනු
- වසර තුළ ලබා දුන් සහ ආපසු ගෙවූ කෙටිකාලීන ණය මුදල්

**2.7 විශේෂඥයකු විසින් ඉටුකර ඇති වැඩ සම්බන්ධ පරීක්ෂණ**

විශේෂඥයකු විසින් ඉටුකර ඇති වැඩ උපයෝගී කරගත් අවස්ථා වලදී ඔවුන් භාවිතයට ගත් මූල්‍ය දත්ත, උපයෝගී කරගන්නා ලද උපකල්පන හා ක්‍රමවේද, අදාළ ව්‍යාපාරය පිළිබඳ විගණකගේ සමස්ථ දැනුම අනුව හා අනෙකුත් විගණන ක්‍රියා පටිපාටිවල ප්‍රතිඵල අනුව සලකා බලන කල, විශේෂඥයාගේ වැඩකටයුතු වල ප්‍රතිඵල විගණක විසින් සලකන ලද අන්දම පිළිබඳ සාක්ෂි විගණන 3 ක සටහන් වී නොතිබිණි.

නිදසුන්:

- දේපල මිලට ගත් වර්ෂය තුළම ප්‍රත්‍යාගණනය කර විශාල ලාභයක් හඳුනාගෙන තිබෙන අවස්ථාවක, එහි වටිනාකම සම්බන්ධයෙන් ව්‍යාපාරය පිළිබඳව සහ එහි පරිසරය සම්බන්ධව විගණකගේ දැනුම සහ වෙනත් විගණන ක්‍රියාපටිපාටි සමඟ එම ඇස්තමේන්තු දක්වන සංගතතාව තක්සේරු නොකර, ව්‍යාපාරයට පරිබාහිරවූ තක්සේරුකරුගේ ප්‍රතිඵලය අදාළ වටිනාකම ලෙස පිළිගැනීම.
- කෘෂිකාර්මික වත්තමක සහ දේපල වෙළඳාමට යොදා ගන්නා නිශ්චල දේපලක ප්‍රමාණාත්මක ප්‍රත්‍යාගණන ලාභයක් සඳහන්වන අවස්ථාවක උපයෝගීකර ගන්නා ලද වැදගත් උපකල්පන, තක්සේරු ආකෘතිය සහ අදාළ දත්ත පරීක්ෂාවට භාජනය නොකිරීම.
- කළමනාකරණය විසින් දේපලක වටිනාකම ලෙස යෝග්‍ය නොවන ආකාරයේ වටිනාකමක් නිගමනය කර තිබෙන විට එය අදාළ වටිනාකම ලෙස පිළිගැනීම

## 3. පොදු සොයා ගැනීම්

සමාලෝචනය කළ විගණන ලේඛනවලින් වැඩි ප්‍රමාණයක් මූලික වශයෙන් විගණන වාර්තාවේ පදනමට සම්බනධ ප්‍රමාණාත්මක හා උචිත වාර්තාකරණයක් කර නොමැති බව තහවුරු විය. ඇතැම් අවස්ථාවන්හි ප්‍රමිතීන්ට අනුකූලව විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කර ඇති බවට සාක්ෂි නොතිබිණ. තවද, මූල්‍ය ප්‍රකාශන සැළැහුම් පරීක්ෂා කිරීමට යොදා ගත් විගණන මෙහෙයුම් හා සැලසුම් සම්බන්ධ සාක්ෂි, වැඩ පත්‍රවල ඇතුළත් වී නොතිබිණි. ඇතැම් විගණනවල සම්බන්ධිත පාර්ශව අතර ගනුදෙනු ප්‍රමාණවත් ලෙස හඳුනා ගැනීමේ අඩුපාඩු පැවති අතර, විශේෂඥයකු විසින් ඉටු කර ඇති වැඩ, ව්‍යාපාරය පිළිබඳව විගණකයා සතු දැනුම අනුව ඇගයීමකට ලක් නොකර ඇති බව පැහැදිලි විය. තවද ඇතැම් විගණන වාර්තා විගණන වාර්තාවලට අදාළ ප්‍රමිතියට අනුකූලව පිළියෙළ කර නොතිබිණ.

# තුලිත ලකුණු පත

මණ්ඩලය විසින් වාර්ෂික ක්‍රියාකාරක සැලසුම් කිරීම පිණිස තුලිත ලකුණු පත යොදාගනු ලැබේ. 2011 සැලැස්ම, 2011 තථ්‍ය සටහන සහ 2012 සැලැස්ම පහත දැක්වේ:

### මූල්‍ය ප්‍රකාශන පරිලෝකය

අපගේ පරිකල්පනමය ලඟාකර ගැනීම පිණිස, මූල්‍ය ප්‍රකාශන පරිශීලනය කරන්නන්ට අප කෙසේ දිස්විය යුතුද?

| ඉලක්කය | මිණුම් දණ්ඩ | 2011 සැලැස්ම | 2011 තථ්‍ය සටහන | 2012 සැලැස්ම |
|---|---|---|---|---|
| නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්ගේ මූල්‍ය ප්‍රකාශන සත්‍ය සහ සාධාරණ ලෙස දැක්වීම | ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිවලට අනුකූලවීම නිශ්චය කිරීමට මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කිරීම | මූල්‍ය ප්‍රකාශන 207 | මූල්‍ය ප්‍රකාශන 213 (සටහන 1) | මූල්‍ය ප්‍රකාශන 300 |
| | ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලවීම නිශ්චය කිරීමට විගණන සමාලෝචනය කිරීම | විගණන 30 | විගණන 30 | විගණන 50 |

### නියාමන ව්‍යවසා පරිලෝකය

අපගේ පරිකල්පනමය ලඟාකර ගැනීම පිණස අප විසින් නියාමනයට භාජනය කරන ආයතන වලට අප කෙසේ දිස්විය යුතුද?

| ඉලක්කය | මිණුම් දණ්ඩ | 2011 සැලැස්ම | 2011 තථ්‍ය සටහන | 2012 සැලැස්ම |
|---|---|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන ලැබීම් | ලැබුණු මූල්‍ය ප්‍රකාශන සංඛ්‍යාව | 1,188 | 1,716 (සටහන 2) | 1,256 |

### අභ්‍යන්තර ක්‍රියාදාම පරිලෝකය

විශේෂ උනන්දුවක් දක්වන පාර්ශවයන් තෘප්තිමත් කිරීම පිණිස අප කුමන අභ්‍යන්තර ක්‍රියාදාමයක් උත්කෘෂ්ටව පවත්වා ගත යුතුද?

| ඉලක්කය | මිණුම් දණ්ඩ | 2011 සැලැස්ම | 2011 තථ්‍ය සටහන | 2012 සැලැස්ම |
|---|---|---|---|---|
| සේවක කාර්ය සාධනය | වාර්ෂික සැලසුම්ගත කාර්ය සාධන ලකුණු ලඟාකර ගැනීම (සටහන 3) | 10,224 | 10,972 | 11,532 |
| වර්තමාන මෙහෙයුම් ඉලක්ක ලඟාකර ගැනීම පිණිස ඇති බාධක ඉවත්කර ගැනීම සඳහා දැනුම වැඩිදියුණු කර ගැනීම | සතිපතා අධ්‍යාපන ක්‍රියාවලිය (අභ්‍යන්තරව) | ප්‍රමිති සම්බන්ධ ඉදිරිපත් කිරීම් 48 | ප්‍රමිති සම්බන්ධ ඉදිරිපත් කිරීම් 48 | ප්‍රමිති සම්බන්ධ ඉදිරිපත් කිරීම් 48 |
| කාලීන ප්‍රතිචාර | ලැබුණු චෝදනා හා ඉල්ලුම් කළ පැහැදිලි කිරීම් සහ ලැබූ තොරතුරු පිළිබඳ අවධානය යොමු කිරීම | සාමාන්‍ය වශයෙන් ලැබුණු හා පිළිතුරු යැවූ දිනයන් හැර දින 5 | දින 5.4 | සාමාන්‍ය වශයෙන් ලැබුණු හා පිළිතුරු යැවූ දිනයන් හැර දින 5 |

# තුලිත ලකුණු පත

**සටහන 1**

සමාලෝචනය කරන ලද මූල්‍ය ප්‍රකාශන

| නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසා ඛාණ්ඩය | 2011 සැලැස්ම | 2011 තථ්‍ය සටහන |
|---|---:|---:|
| බැංකු | 8 | 8 |
| රක්ෂණ ව්‍යාපාර | 8 | 8 |
| මූල්‍ය සමාගම් | 17 | 18 |
| බදු ව්‍යාපාර | 7 | 6* |
| වෙනත් ලැයිස්තුගත සමාගම් | 110 | 120 |
| වැදගත් බවින් වැඩි රාජ්‍ය ව්‍යාපාර | 13 | 8** |
| වෙනත් රාජ්‍ය සංස්ථා සහ රජයේ පාලනය යටතේ ඇති ව්‍යාපාර | 4 | 5 |
| වෙනත් සමාගම් | 40 | 40 |
| එකතුව | 207 | 213 |

** වර්ෂය තුළ සමාලෝචනය කරන ලද මූල්‍ය සමාගමකින් ඉල්ලුම් කරන ලද එකගතාවයක් සම්බන්ධව, එහි කළමනාකාරිත්වය විසින් අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිය බලාපොරොත්තුවෙන් සිටින බැවින් නිම කිරීමට නොහැකි විය.*

*** එහි හිඟය සම්බන්ධව තත්ත්වය පහත පරිදි වේ:*

*<u>සමාලෝචනය කෙරෙමින් පවතින ආයතන</u>*

*සී/ස ගුවන් තොටුපළ හා ගුවන් සේවා සමාගම*

*සී/ස ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව*

*ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය*

*ශ්‍රී ලංකා වරාය අධිකාරිය*

*<u>මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම අවසන් නොවූ බැවින්, මණ්ඩලය වෙත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකළ ආයතන</u>*

*ලංකා ගමනා ගමන මණ්ඩලය (CTB)*

**සටහන 2**

මණ්ඩලය වෙත ඉදිරිපත් නොකළ, පෙර වර්ෂ සඳහා අදාළ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධව පරීක්ෂාකාරීව කරන ලද පසුක්‍රියාවලියේ ප්‍රතිඵලයක් ලෙස ලැබුනු මූල්‍ය ප්‍රකාශන.

**සටහන 3**

වාර්ෂික වාර්තාවල අඩංගු පිටු සංඛ්‍යාව සහ විගණන වාර්තා කොන්දේසි සහිත හෝ රහිතවීම මත කාර්ය සාධන ලකුණු පදනම් වී ඇත. තවද, සමාලෝචනවල සොයා ගැනීම්වල ස්වභාවය අනුවද මෙම කාර්ය සාධන ලකුණුවලට ගැලපීම් කරනු ලැබේ.

# විගණකාධිපති වාර්තාව

**විගණකාධිපති දෙපාර්තමේන්තුව**
**கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்**
**AUDITOR GENERAL'S DEPARTMENT**

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No. | ඊඑෆ්/අයි/එස්එල්ඒඒඑස්එම්බී/2011 | |
| ඔබේ අංකය<br>உமது இல<br>Your No. | | |
| දිනය<br>திகதி<br>Date | 2012 ජූනි 21 දින. | |

සභාපති,
ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්‍ෂණ මණ්ඩලය

**<u>ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව</u>**

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්‍ෂණ මණ්ඩලයේ 2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳ ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනතේ 33(2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් මණ්ඩලයේ සභාපති වෙත යථාකාලයේ දී නිකුත් කරනු ලැබේ.

**<u>මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම</u>**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

**<u>විගණකගේ වගකීම</u>**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

අංක 306/72 පොල්දුව පාර,
බත්තරමුල්ල , ශ්‍රී ලංකාව

இல. 306/72, பொல்துவ வீதி,
புத்தரமுல்லை இலங்கை

No.306/72, Polduwa Road,
Battaramulla , Sri Lanka

දුරකථනය / தொலைபேசி / Telephone: 2887028 - 34

ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No.: 2887223

ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ- மெயில் / E-mail.: oaggov@sltnet.lk

# විගණකාධිපති වාර්තාව

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**<u>මූල්‍ය ප්‍රකාශන</u>**

**මතය**

මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**<u>පාර්ලිමේන්තුවට වාර්තා කිරීම</u>**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) වගන්තිය ප්‍රකාර මාගේ වාර්තාව යථාකාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ඇත.

**එච්.ඒ.එස්. සමරවීර**
*විගණකාධිපති*

# මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

| *දෙසැම්බර් 31 වන දිනට* | සටහන | **2011** රු. | 2010 රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල, පිරියත හා උපකරණ | 3 | **11,032,435** | 2,519,432 |
| තැන්පතු | 4 | **1,340,550** | 1,340,550 |
| | | **12,372,985** | 3,859,982 |
| **ජංගම වත්කම්** | | | |
| තොග | 5 | **389,730** | 276,740 |
| ලැබිය යුතු දෑ | 6 | **1,204,415** | 1,041,734 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 7 | **2,980,160** | 528,465 |
| | | **4,574,305** | 1,846,939 |
| **මුළු වත්කම්** | | **16,947,290** | 5,706,921 |
| **වගකීම්** | | | |
| **ජංගම නොවන වගකීම්** | | | |
| විලම්බිත ආදායම් - රාජ්‍ය ප්‍රදාන | 8 | **8,526,348** | 748,299 |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 9 | **3,846,637** | 3,111,683 |
| | | **12,372,985** | 3,859,982 |
| **ජංගම වගකීම්** | | | |
| විලම්බිත ආදායම් - රාජ්‍ය ප්‍රදාන | 10 | **4,086,687** | 1,178,871 |
| ගෙවිය යුතු දෑ | 11 | **487,618** | 668,068 |
| | | **4,574,305** | 1,846,939 |
| **මුළු වගකීම්** | | **16,947,290** | 5,706,921 |

*21 වන පිටුවේ සිට 24 වන පිටුව දක්වා සඳහන් මූල්‍ය ප්‍රකාශනවලට සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍යම කොටසකි.*

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයන්ගේ වගකීමකි.

මණ්ඩලයේ සාමාජිකයන් සඳහා සහ ඔවුන් වෙනුවෙන් අනුමත කරමු.

මණ්ඩලයේ සභාපති | අධ්‍යක්ෂ ජනරාල් | මූල්‍ය හා පරිපාලන කළමනාකාරී

2012 ජනවාරි 31 දින

# මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රකාශනය

| *දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා* | සටහන | **2011** රු. | 2010 රු. |
|---|---|---|---|
| **ආදායම්** | | | |
| රාජ්‍ය ප්‍රදාන | 12 | **37,235,135** | 31,033,932 |
| අඩු කළා: ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයට මුදාහල රාජ්‍ය ප්‍රදාන | | **2,500,000** | 2,500,000 |
| | | **34,735,135** | 28,533,932 |
| **මෙහෙයුම් වියදම්** | | | |
| මණ්ඩලයේ සාමාජිකයන්ගේ දීමනා | | **(306,100)** | (135,000) |
| විගණන ගාස්තු | 13 | **93,409** | (557,750) |
| කාර්ය මණ්ඩල පිරිවැය | 14 | **(13,669,810)** | (11,957,572) |
| පුවත්පත් දැන්වීම් | | **(1,391,803)** | (535,718) |
| කාර්යාල කුලී සහ ගොඩනැගිලි නඩත්තු වියදම් | | **(5,320,648)** | (5,292,023) |
| ක්ෂය සහ ක්‍රමක්ෂය පිරිවැය | 3 | **(1,446,748)** | (1,000,331) |
| සමාලෝචනය සඳහා වූ වෘත්තීය ගාස්තු | | **(2,130,000)** | – |
| වෙනත් පරිපාලන වියදම් | | **(10,563,435)** | (9,055,538) |
| **වර්ෂයේ ශුද්ධ අතිරික්තය/හිඟය** | | **–** | – |

*21 වන පිටුවේ සිට 24 වන පිටුව දක්වා සඳහන් මූල්‍ය ප්‍රකාශන වලට සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍යම කොටසකි.*



SLAASMB
ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන
ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය

# ශුද්ධ වත්කම් වෙනස්වීම පිළිබඳ ප්‍රකාශනය

| | සමුච්චිත අරමුදල රු. |
|---|---|
| **2009 දෙසැම්බර් 31 දිනට ශේෂය** | – |
| වර්ෂයේ ශුද්ධ අතිරික්තය/(හිඟය) | – |
| **2010 දෙසැම්බර් 31 දිනට ශේෂය** | – |
| වර්ෂයේ ශුද්ධ අතිරික්තය/(හිඟය) | – |
| **2011 දෙසැම්බර් 31 දිනට ශේෂය** | – |

*21 වන පිටුවේ සිට 24 වන පිටුව දක්වා සඳහන් මූල්‍ය ප්‍රකාශනවලට සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍යම කොටසකි.*

# මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| *දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා* | සටහන | 2011<br>රු. | 2010<br>රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහයන්** | | | |
| වර්ෂයේ ශුද්ධ අතිරික්තය/(හිඟය) | | – | – |
| ගැලපීම් | | | |
| වර්ෂය තුළ ලැබුණු රාජ්‍ය ප්‍රදාන | | 47,921,000 | 31,508,960 |
| මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රකාශනයට මාරු කළ විලම්බිත රාජ්‍ය ප්‍රදාන | | (37,235,135) | (31,033,932) |
| ජංගම නොවන වත්කම් ලෙස ලැබූ රාජ්‍ය ප්‍රදාන | | (9,000,000) | – |
| ක්ෂය වීම් | | 1,446,748 | 1,000,331 |
| කාර්යාල උපකරණ ඉවත්කිරීමේදී වූ අලාභය | | 7,988 | 12 |
| පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | | 734,954 | 238,524 |
| කාරක ප්‍රාග්ධන වෙනස්වීම්වලට පෙර අතිරික්ත ආදායම | | 3,875,555 | 1,713,895 |
| තොගවල (වැඩිවීම)/අඩුවීම | | (112,990) | 27,723 |
| ලැබිය යුතු මුදල්වල (වැඩිවීම)/අඩුවීම | | (162,681) | (40,161) |
| ගෙවිය යුතු මුදල්වල වැඩිවීම/(අඩුවීම) | | (180,450) | (924,273) |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන් | | 3,419,434 | 777,184 |
| | | | |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන්** | | | |
| දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම් | | (967,739) | (1,277,156) |
| ශුද්ධ මුදල් ප්‍රවාහයන් | | 2,451,695 | (499,972) |
| | | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ප්‍රවාහයන්** | | – | – |
| **මුදල් සහ මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | | 2,451,695 | (499,972) |
| වර්ෂය ආරම්භයේ වූ මුදල් සහ මුදල් හා සමාන දෑ | | 528,465 | 1,028,437 |
| **වර්ෂය අවසානයේ වූ මුදල් සහ මුදල් හා සමාන දෑ** | 7 | 2,980,160 | 528,465 |

*21 වන පිටුවේ සිට 24 වන පිටුව දක්වා සඳහන් මූල්‍ය ප්‍රකාශන වලට සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍යම කොටසකි.*

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

## 1. සංස්ථාපිත තොරතුරු

ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම, 2012 ජනවාරි 31 දින මණ්ඩලයේ සාමාජිකයන්ගේ එකඟතාවය මත අනුමත කරන ලදී. ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත අනුව සංස්ථාපිත කරන ලද ව්‍යවස්ථාපිත මණ්ඩලයකි.

මණ්ඩලයේ කාර්යභාරය වන්නේ 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනතේ නියමයන්ට අනුව ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති සහ ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලවීම සමීක්ෂණය කිරීමයි.

2011 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ ස්ථිර සේවකයන් 8 ක් සහ තාවකාලික සේවකයන් 3 ක් සේවය කරන ලදී. (2010 දෙසැම්බර් 31 දිනට ස්ථිර සේවකයන් 7 ක් සහ තාවකාලික සේවකයන් 3 ක් විය.)

## 2. ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති

### මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේ පදනම

මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන, ඓතිහාසික පිරිවැය පදනම මත පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට හා 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනතේ නියමයන් යටතේ සම්මත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සකස් කර ඇත.

මණ්ඩලය විසින් යොදාගත් සියළුම ගිණුම් ප්‍රතිපත්ති පෙර වර්ෂයේ ගිණුම් ප්‍රතිපත්ති හා අනුකූල වේ. වර්තමාන ඉදිරිපත් කිරීමට අනුකූලතාවය දැක්වීම පිණිස පසුගිය වර්ෂයේ සංසන්දනාත්මක තොරතුරු වලට අවශ්‍ය අවස්ථා වලදී ගැලපීම් කර ඇත.

### මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දිනයෙන් පසු සිදුවූ සිද්ධීන්

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දිනයෙන් පසු සිදුවූ සියළුම ප්‍රමාණාත්මක සිද්ධීන් පිළිබඳව අදාළභාවය අනුව අවශ්‍ය ගැලපීම් හෝ හෙළිදරව් කිරීම් මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට ඇතුළත් කර ඇත.

### දේපල, පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණ ඒවායේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය අඩු කළ පසු අගයට දක්වා ඇත. වත්කම්වල තක්සේරු කරන ලද ප්‍රයෝජනවත් ජීවිත කාලය තුළ සරල රේඛීය ක්‍රමය යටතේ ක්ෂය සඳහා ප්‍රතිපාදනය කෙරේ.

| විස්තර | තක්සේරු කරන ලද ජීවිත කාලය |
|---|---|
| මෝටර් වාහන | වර්ෂ 5 |
| කාර්යාල උපකරණ | වර්ෂ 4 |
| ගෘහ භාණ්ඩ | වර්ෂ 6-10 |
| පොත්පත් හා ප්‍රකාශන | වර්ෂ 3 |

මිලදී ගත් වර්ෂයට හා විකුණන ලද වර්ෂයට පාවිච්චි කරන ලද කාලයට අනුරූපව ක්ෂය ගණනය කරන අතර මිලට ගත් මාසයේදී මුළු මාසයටම ක්ෂය ගණනය කරන නමුත් විකුණන මාසයට ක්ෂය ගණනය නොකෙරේ.

පොත්පත් හා සඟරා හැර වටිනාකම රු. 7,500/- ට අඩු සියළුම අයිතමයන්, ගිණුම්කරණ ප්‍රමිති, විගණන ප්‍රමිති හා වටිනාකම රු. 1,000/- ට අඩු අනෙකුත් ප්‍රකාශන, මිලට ගත් වර්ෂ තුළදීම වියදමක් ලෙස සලකනු ලැබේ.

### තොග

තොග අගය කරන්නේ පිරිවැය සහ ශුද්ධ උපලබ්ධි වටිනාකමෙන් අඩු අගයටය. තොග පිරිවැය තීරණය කරන්නේ ප්‍රථමයෙන් ලැබීම් ප්‍රථමයෙන් නිකුත් කිරීමේ (ප්‍ර.ලැ.ප්‍ර.නි.) පදනම අනුවය.

### ලැබිය යුතු දෑ

සියළුම ලැබිය යුතු දෑ ඒවා උපලබ්ධි වේ යැයි ඇස්තමේන්තුගත අගයට දක්වන අතර, බොල් සහ අඩමාන ණය සඳහා වෙන්කිරීම් අවශ්‍යතාවය අනුව කරනු ලැබේ.

### මුදල් සහ මුදල් හා සමාන දෑ

බැංකුවේ සහ අතැති මුදල් සහ කල්පිරෙන දින තෙක් ඇති කෙටිකාලීන තැන්පතු, ඒවායේ පිරිවැයට දැක්වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සඳහා මුදල් සහ මුදල් හා සමාන දෑ සමන්විත වනුයේ අතැති මුදල් සහ බැංකු තැන්පතුවලින් බැංකු අයිරා හිලව් කිරීමෙනි.

### ගෙවිය යුතු දෑ

ගෙවිය යුතු දෑ සඳහා වගකීම, ගෙවීමට බලාපොරොත්තුවන මුදල් සහ මුදල් හා සමාන දෑ වල වටිනාකමට දැක්වේ.

### විශ්‍රාම ප්‍රතිලාභ

1983 අංක 12 දරන සේවක පාරිතෝෂික පනත අනුව ගෙවිය යුතු පාරිතෝෂික සඳහා වෙන්කිරීම් මූල්‍ය ප්‍රකාශන වල කර ඇති අතර, මෙහිදී කිසියම් සේවකයෙක් පනතට අනුකූලව පාරිතෝෂික හිමිවීමට අදාළ නිශ්චිත සේවා කාලය සම්පූර්ණ කර නොතිබුණත් එවැනි සේවකයින්ට පවා මූල්‍ය තත්ත්වය පිළිබඳව ප්‍රකාශනයේ දිනට සේවක පාරිතෝෂික සඳහා හිමිකම් ඇත්තේය යන පදනම මත පිහිටා වෙන්කිරීම් කර ඇත.

### රාජ්‍ය ප්‍රදාන

ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාරයෙන් ලද රාජ්‍ය ප්‍රදාන ආදායමක් ලෙස හඳුනාගන්නේ අදාළ වියදම හඳුනාගනු ලබන කාලපරිච්ඡේදයේදීමය.

ඉදිරි කාලපරිච්ඡේදයන් තුළ වියදමක් වන වත්කම් අත්පත් කරගැනීම සඳහා භාවිතා කරනු ලබන රාජ්‍ය ප්‍රදාන විලම්බිත ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

මුදල් සහ මුදල් හා සමාන දෑ ඇතුළු අනෙකුත් වත්කම්වලින් වගකීම් (ලැබුණු රාජ්‍ය ප්‍රදානවලට අදාළ වගකීම් හැර) අඩු කළ විට නිරූපණය වන රාජ්‍ය ප්‍රදාන වගකීමක් ලෙස හඳුනාගනු ලැබේ.

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

### 3. දේපල, පිරියත හා උපකරණ

| | මෝටර් වාහන 2011 රු. | මෝටර් වාහන 2010 රු. | කාර්යාල උපකරණ 2011 රු. | කාර්යාල උපකරණ 2010 රු. | ගෘහ භාණ්ඩ 2011 රු. | ගෘහ භාණ්ඩ 2010 රු. | පුස්තකාල පොත් 2011 රු. | පුස්තකාල පොත් 2010 රු. | මුළු එකතුව 2011 රු. | මුළු එකතුව 2010 රු. |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| **පිරිවැය** | | | | | | | | | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | **2,675,000** | 2,675,000 | **6,139,119** | 5,781,730 | **9,696,286** | 9,696,286 | **2,858,713** | 2,805,693 | **21,369,118** | 20,958,709 |
| එකතු කිරීම් | **9,000,000** | – | **756,615** | 1,224,136 | **186,838** | – | **24,286** | 53,020 | **9,967,739** | 1,277,156 |
| ඉවත් කිරීම් | **–** | – | **(99,990)** | (866,747) | **(96,231)** | – | **–** | – | **(196,221)** | (866,747) |
| වර්ෂය අවසානයේ ශේෂය | **11,675,000** | 2,675,000 | **6,795,744** | 6,139,119 | **9,786,893** | 9,696,286 | **2,882,999** | 2,858,713 | **31,140,636** | 21,369,118 |
| **සමුච්චිත ක්ෂයවීම්** | | | | | | | | | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | **2,674,998** | 2,674,998 | **4,531,074** | 4,820,198 | **8,893,546** | 8,591,211 | **2,750,068** | 2,629,683 | **18,849,686** | 18,716,090 |
| වර්ෂය තුළ ක්ෂය වියදම් | **520,000** | – | **657,061** | 577,611 | **194,604** | 302,335 | **75,083** | 120,385 | **1,446,748** | 1,000,331 |
| ඉවත් කිරීම් මත ක්ෂය | **–** | – | **(99,989)** | (866,735) | **(88,244)** | – | **–** | – | **(188,233)** | (866,735) |
| වර්ෂය අවසානයේ ශේෂය | **3,194,998** | 2,674,998 | **5,088,146** | 4,531,074 | **8,999,906** | 8,893,546 | **2,825,151** | 2,750,068 | **20,108,201** | 18,849,686 |
| වර්ෂය අවසානයේ ලියා හරින ලද අගය | **8,480,002** | 2 | **1,707,598** | 1,608,045 | **786,987** | 802,740 | **57,848** | 108,645 | **11,032,435** | 2,519,432 |

| | 2011 රු. | 2010 රු. |
|---|---|---|
| **4. තැන්පතු** | | |
| කාර්යාල කුලී තැන්පතු | **1,340,550** | 1,340,550 |
| **5. තොග** | | |
| ලිපි ද්‍රව්‍ය | **389,730** | 276,740 |
| **6. ලැබිය යුතු දෑ** | | |
| ඉදිරියට කළ ගෙවීම් | **1,124,415** | 961,734 |
| තැන්පතු | **80,000** | 80,000 |
| | **1,204,415** | 1,041,734 |
| **7. මුදල් සහ මුදල් හා සමාන දෑ** | | |
| බැංකුවේ සහ අතැති මුදල් | **2,980,160** | 528,465 |
| **8. විලම්බිත ආදායම් - රාජ්‍ය ප්‍රදාන (ජංගම නොවන)** | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | **748,299** | 710,010 |
| ජංගම නොවන වත්කම් අත්පත් කර ගැනීම සඳහා ලැබුණු සහ වැය කළ ප්‍රදාන | **967,739** | 1,277,156 |
| ජංගම නොවන වත්කම් ලෙස ලැබු රාජ්‍ය ප්‍රදාන | **9,000,000** | – |
| වර්ෂය තුළ ක්ෂය සහ ක්‍රමක්ෂය පිරිවැය | **(1,446,748)** | (1,000,331) |
| කාර්යාල උපකරණ ඉවත් කිරීමේදී වූ අලාභය | **(7,988)** | (12) |
| සේවක පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | **(734,954)** | (238,524) |
| වර්ෂය අවසානයේ ශේෂය | **8,526,348** | 748,299 |
| **නිරූපණය වන්නේ -** | | |
| දේපල, පිරියත හා උපකරණ | **11,032,435** | 2,519,432 |
| තැන්පතු (ජංගම නොවන) | **1,340,550** | 1,340,550 |
| අඩු කළා: සේවක පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | **(3,846,637)** | (3,111,683) |
| | **8,526,348** | 748,299 |

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

| | 2011<br>රු. | 2010<br>රු. |
|---|---|---|
| **9. පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන** | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 3,111,683 | 2,873,159 |
| වර්ෂය තුළ ප්‍රතිපාදන | 734,954 | 238,524 |
| වර්ෂය තුළ ගෙවීම් | – | – |
| වර්ෂය අවසානයේ ශේෂය | 3,846,637 | 3,111,683 |

පාරිතෝෂික සඳහා ප්‍රතිපාදනයට බාහිර අරමුදල් සම්පාදනයක් නොමැත.

| | 2011<br>රු. | 2010<br>රු. |
|---|---|---|
| **10. විලම්බිත ආදායම් - රාජ්‍ය ප්‍රදාන (ජංගම)** | | |
| වර්ෂය ආරම්භයේ ශේෂය | 1,178,871 | 742,132 |
| තොග සහ ඉදිරියට කළ ගෙවීම්වල වැඩිවීම/(අඩුවීම) | 275,671 | 12,438 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ වල වැඩිවීම/(අඩුවීම) | 2,451,695 | (499,972) |
| ගෙවිය යුතු දෑ වල (වැඩිවීම)/අඩුවීම | 180,450 | 924,273 |
| වර්ෂය අවසානයේ ශේෂය | 4,086,687 | 1,178,871 |
| **නිරූපණය වන්නේ** | | |
| තොග | 389,730 | 276,740 |
| ලැබිය යුතු දෑ | 1,204,415 | 1,041,734 |
| මුදල් සහ මුදල් හා සමාන දෑ | 2,980,160 | 528,465 |
| අඩු කළා: ගෙවිය යුතු දෑ | (487,618) | (668,068) |
| | 4,086,687 | 1,178,871 |

| | 2011<br>රු. | 2010<br>රු. |
|---|---|---|
| **11. ගෙවිය යුතු දෑ** | | |
| විගණන ගාස්තු සඳහා වෙන්කිරීම් | 233,051 | 442,984 |
| ගෙවිය යුතු අභ්‍යන්තර ගොඩනැගිලි සැලසුම් වියදම් | 41,642 | 41,642 |
| වෙනත් ගෙවිය යුතු දෑ | 212,925 | 183,442 |
| | 487,618 | 668,068 |

| | 2011<br>රු. | 2010<br>රු. |
|---|---|---|
| **12. රාජ්‍ය ප්‍රදාන** | | |
| වර්ෂය තුළ ලැබුණු රාජ්‍ය ප්‍රදාන | 47,921,000 | 31,508,960 |
| ජංගම නොවන වත්කම් ලෙස ලැබූ රාජ්‍ය ප්‍රදාන | (9,000,000) | – |
| ප්‍රාග්ධන වියදම් සඳහා යෙදවූ ප්‍රදාන | (967,739) | (1,277,156) |
| ශුද්ධ ජංගම වත්කම් සඳහා වැය කළ ප්‍රදාන | (2,907,816) | (436,739) |
| වර්ෂය තුළ ක්ෂය සහ ක්‍රමක්ෂය පිරිවැය | 1,446,748 | 1,000,331 |
| කාර්යාල උපකරණ ඉවත්කිරීමේදී වූ අලාභය | 7,988 | 12 |
| සේවක පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 734,954 | 238,524 |
| මූල්‍ය ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රකාශනයේ දැක්වෙන රාජ්‍ය ප්‍රදාන | 37,235,135 | 31,033,932 |

| | 2011<br>රු. | 2010<br>රු. |
|---|---|---|
| **13. විගණන ගාස්තු** | | |
| වර්ෂයේ වියදම | 116,525 | 221,492 |
| පෙර වර්ෂ සඳහා ඌන/(අධි) වෙන් කිරීම් | (209,934) | 336,258 |
| | (93,409) | 557,750 |

# මූල්‍ය ප්‍රකාශනවලට සටහන්

| | 2011 රු. | 2010 රු. |
|---|---|---|
| **14. කාර්ය මණ්ඩල පිරිවැය** | | |
| කාර්ය මණ්ඩල වේතන | 9,384,985 | 8,419,903 |
| සේවක අර්ථසාධක අරමුදල | 1,096,810 | 981,765 |
| සේවා නියුක්තයන්ගේ භාරකාර අරමුදල | 274,202 | 245,441 |
| වාහන කුලී | 1,448,655 | 1,448,052 |
| සේවක පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන | 734,954 | 238,524 |
| වෙනත් කාර්ය මණ්ඩල ප්‍රතිලාභ | 730,204 | 623,887 |
| | 13,669,810 | 11,957,572 |

**15. සම්බන්ධිත පාර්ශ්වයන් අතර ගනුදෙනු**

වර්ෂය තුළ මණ්ඩලයේ සාමාජිකයන් වූ සී.එල්.කේ.පී. ජයසූරිය, එස්. රාජපක්ෂ, ආර්. ත්‍යාගරාජා සහ ඩබ්.කේ.එච්. වේගපිටිය යන මහත්වරු සහ එන්. සිවප්‍රගාසම් මෙනෙවිය සමීක්ෂණයට භාජනය කරන ඇතැම් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්වල අධ්‍යක්ෂක ධුර හෝ ජ්‍යෙෂ්ඨ නිලධාරී තනතුරු දැරූහ. මණ්ඩලයේ සාමාජිකයින් වන ඒ. හේරත්, ඩී.ටී.එස්.එච්. මුදලිගේ සහ එස්. රාජපක්ෂ යන මහත්වරු මණ්ඩලය විසින් සමීක්ෂණයට භාජනය කරන ඇතැම් නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්වල විගණකවරුන් වන ක්‍රියාකාරී ගණකාධිකරණ ආයතනවල හවුල්කරුවන් විය. අදාළ වර්ෂය තුළ සම්බන්ධිත පාර්ශවයන් අතර ගනුදෙනු කිසිවක් නොතිබිණ.

**16. ප්‍රාග්ධන වගකීම්**

2011 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධන වගකීම් කිසිවක් නොමැත. (2010 දෙසැම්බර් 31 ට - නැත)

**17. අසම්භාව්‍ය වගකීම්**

2011 දෙසැම්බර් 31 දිනට අසම්භාව්‍ය වගකීම් කිසිවක් නොමැත. (2010 දෙසැම්බර් 31 ට - නැත)

**18. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දිනයෙන් පසු වූ සිද්ධීන්**

මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට හෝ හෙළිදරව් කිරීමට තරම් ප්‍රමාණාත්මක වූ සිද්ධීන් කිසිවක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ දිනයෙන් පසු සිදුවී නොමැත.

# නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන්

පනත සහ පනත යටතේ කරනු ලැබූ නියෝග ප්‍රකාර පහත සඳහන් ආයතන නිශ්චිත ව්‍යාපාරික ව්‍යවසායයන් ලෙස නිර්වචනය කර ඇත:

- 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍ර ලත් සමාගම්
- රක්‍ෂණ ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යෑම සඳහා 1962 අංක 25 දරන රක්ෂණ පාලන කිරීමේ පනත යටතේ බලය පවරන ලද සමාගම්
- කල් බදු ව්‍යාපාර කටයුතු වල නිරතවී සිටින සමාගම්
- ණය නිශ්කාෂණ සමාගම්
- 1988 අංක 78 දරන මූල්‍ය සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද සමාගම්
- ඒකක භාර ක්‍රියාත්මක කිරීම සඳහා 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍ර ලත් සමාගම්
- අරමුදල් පාලන සමාගම්
- ව්‍යාපාර වස්තු තැරැව්කරුවන් ලෙස හෝ ව්‍යාපාර වස්තු වෙළෙන්දන් ලෙස ව්‍යාපාර කටයුතු පවත්වාගෙන යෑමට 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍ර ලත් සමාගම්
- ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් ලෙස ක්‍රියාකිරීමට 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍ර ලත් සමාගම්
- 1987 අංක 36 දරන ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභා පනත යටතේ බලපත්‍ර දී ඇති ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක ලැයිස්තුගත සමාගම්
- අනෙකුත් සමාගම්
  - (අ) රුපියල් මිලියන 500 කට වැඩි වාර්ෂික පිරිවැටුමක් ඇති සමාගම්
  - (ආ) ඉකුත් මුදල් වර්ෂය අවසානයේදී කොටස් හිමියන්ගේ ස්කන්ධය රුපියල් මිලියන 100 කට වැඩිය තිබූ සමාගම්
  - (ඇ) ඉකුත් මුදල් වර්ෂය අවසානයේ දළ වත්කම් රුපියල් මිලියන 300 කට වැඩිය තිබූ සමාගම්
  - (ඈ) ඉකුත් වර්ෂය අවසානයේදී බැංකුවලට සහ අනිකුත් මූල්‍ය ආයතනවලට රුපියල් මිලියන 100 කට වඩා වැඩි බැරකම් පැවති සමාගම්
  - (ඉ) කාර්ය මණ්ඩලයේ සේවකයින් 1,000 කට වැඩිය ඇති සමාගම්
- භාණ්ඩ අලෙවියෙහි හෝ සේවා සැලසීමෙහි නියුක්ත රාජ්‍ය සංස්ථා
- ඉහත සඳහන් වර්ග වලින් කවර හෝ වර්ගයකට වැටෙන එක් සමාගමක් ඇතුළත් සමාගම් සමූහයක්. මෙම කාර්යය සඳහා 'සමාගම් සමූහය' යන්නෙන්, සමාගම් පනත යටතේ ස්වකීය ගිණුම් ඒකාබද්ධ කළ යුතු පාලක සමාගමක් හා එහි පාලිත සමාගම් අදහස් වේ.

# සටහන්

# සටහන්

SLAASMB
ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන
ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය

# සටහන්

**ආයතනයේ නම**

ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති
සමීක්ෂණ මණ්ඩලය

**නෛතික තත්ත්වය**

1995 අංක 15 දරන පනත අනුව
සංස්ථාපිත කරන ලද ව්‍යවස්ථාපිත
මණ්ඩලයකි

**සංස්ථාපිත කරන ලද රට**

ශ්‍රී ලංකාව

**ප්‍රධාන කාර්යාලය**

තෙවන මහල
293, ගාලු පාර
කොළඹ 3
දුරකථන අංක: 2301210
ෆැක්ස්: 2301211
විද්‍යුත් තැපෑල: **slaasmb@sltnet.lk**

**වෙබ් අඩවිය**

**www.slaasmb.org**

**විගණකවරුන්**

විගණකාධිපති
විගණකාධිපති දෙපාර්තමේන්තුව
306/72, පොල්දූව පාර
බත්තරමුල්ල

**බැංකුකරුවන්**

ලංකා බැංකුව

**නීති උපදේශකවරු**

නීතිපතිතුමා
නීතිපති දෙපාර්තමේන්තුව
කොළඹ 12

**ශ්‍රී ලංකා ගිණුම් හා විගණන**
**ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය**
තෙවන මහල
293, ගාලු පාර
කොළඹ 3
ශ්‍රී ලංකාව